නිපුණතාව 01-ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න හා ඒවා විසඳා ගන්නා විකල්ප ක්‍රම තුලනාත්මකව විග්‍රහ කරයි.

නිපුණතා මට්ටම - ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය පරීක්ෂා කරයි.

## ආර්ථික විද්‍යාව පිළිබඳ නිර්වචන -

**"විකල්ප භාවිත සහිත හිඟ සම්පත් හා අසීමිත මිනිස් වුවමනා අතර සම්බන්ධතාව අධ්‍යයනය කරන විෂය ආර්ථික විද්‍යාවයි. "**

**"සීමිත සම්පත්වලින් අසීමිත මිනිස් වුවමනාවන් සපුරා ගන්නේ කෙසේදැයි හදාරනු ලබන විද්‍යාව ආර්ථික විද්‍යාවයි."**

## ආර්ථික විද්‍යාව ඉගෙනීමේ වැදගත්කම -

1.රාජ්‍ය පාලනයේ දී වැදගත් වීම.
2.සාර්ථක පුරවැසියෙකු ලෙස කටයුතු කිරීමට වැදගත් වීම.
3.ආර්ථික සංසිද්ධි වඩාත් හොඳින් තේරුම් ගැනීමට වැදගත් වීම.
4.ආයෝජකයන්ට,පාරිභෝගිකයන්ට සහ නිෂ්පාදකයන්ට කාර්යක්ෂම තීරණ ගැනීමේ දී වැදගත් වීම.
5.ඡන්ද දායකයන්ට සිය ඡන්දය භාවිත කිරීමේ දී වැදගත් වීම.
6.පාසල් ශිෂ්‍යයන්ට තාර්කිකව සිතා තීරණ ගැනීමට වැදගත් වීම.
7.පුද්ගලයෙකුට වඩාත් හොඳ රැකියාවක් තෝරා ගැනීමේ දී වැදගත් වීම.

## අභ්‍යාස

1.සූක්ෂම ආර්ථික විද්‍යාව යනු කුමක්ද?
2.සූක්ෂම ආර්ථික විද්‍යාවේ දී අධ්‍යයනය කෙරෙන ඒකක සඳහා නිදසුන් කීපයක් දෙන්න.
3.සාර්ව ආර්ථික විද්‍යාව යනු කුමක්ද?
4.සාර්ව ආර්ථික විද්‍යාවේ දී අධ්‍යයනය කෙරෙන ඒකක සඳහා නිදසුන් කීපයක් දෙන්න.
5."යථානුරූපී ප්‍රකාශ" හා "අභිමතානුරූපී ප්‍රකාශ" යන පද උදාහරණ සමඟ පැහැදිලි කරන්න.